# දොම්පෙ ප්‍රාදේශීය සභාව

## 2025 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීම සඳහා සැපයුම්කරුවන් සහ කර්මාන්ත වැඩ සිදු කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් 2024/10/01 දින සිට 2024/11/15 දින ප.ව.3.00 දක්වා සතියේ සෑම වැඩ කරන දිනකම භාර ගනු ලැබේ.

ලියාපදිංචිය ඉල්ලුම් කරන ආයතනයේ හෝ පුද්ගලයාගේ ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම් පත්‍රයක් ඔබ විසින්ම සකස් කර ගත යුතුයි. මෙම සියලු අයදුම්පත් ලියාපදිංචි ගාස්තු සමග ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, දෙම්පෙ ප්‍රාදේශීය සභාව, කිරිදිවැල යන ලිපිනයට 2024-11-15 වන දින ප.ව. 3.00 ට පෙර ලැබෙන සේ එවිය යුතුය. සැපයුම්කරුවෙකුට ඕනෑම අයිතම ප්‍රමාණයක් සැපයීම වෙනුවෙන් ලියාපදිංචි විය හැකි අතර, එක් අයිතමයක් වෙනුවෙන් රු.2,000.00 (බදු රහිත) ගෙවිය යුතුය. මේ සඳහා මුදල් ඇණවුම් භාර නොගන්නා අතර, සතියේ වැඩ කරන දිනක පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කිරිදිවැල පිහිටි ප්‍රධාන කාර්යාලය වෙත පැමිණ මුදලින් ගෙවිය හැකිය.චෙක්පත් මගින් මුදල් ගෙවනු ලබන්නේ නම් සභාපති දෙම්පෙ ප්‍රාදේශීය සභාව යන නමින් චෙක්පත් ලිවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය 2025" යනුවෙන් සඳහන් කළ යුතුය.

**උපලේඛන අංක 01**

**(අ).සැපයුම්**

1. කාර්යාල උපකරණ (වානේ, ප්ලාස්ටික් හා ලී බඩු උපකරණ).
2. ලිපි ද්‍රව්‍ය.
3. විදී පහන් කටටල සහ සියලුම විදුලි තඩත්තු උපකරණ.
4. කසළ කරත්ත, සෞඛ්‍ය උපකරණ සැපයීම.
5. ගොඩනැගිලි ද්‍රව්‍ය හා තීන්ත වර්ග.
6. වාහන අලුත් වැඩියා කිරීම, වින් කරීන්, පේන්ට් ආදිය.
7. කර්මාන්ත උපකරණ, මාර්ග උපකරණ, උදලු තල හා කම්මල් ආවුද සැපයීම.
8. නිල ඇඳුම් රෙදි හා පාවහන්.
9. කොන්ක්‍රීට් හියුම් පයිප්ප හා සෙප්ටික් ටැන්ක්.
10. සියලු භාර වර්ග හා කෝලාස්.
11. රෝනියෝ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ගණක යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර හා උපාංග සැපයීම.
12. විෂ බීජ නාශක ද්‍රව්‍ය සැපයීම.
13. ඉලෙක්ට්‍රොනික් උපකරණ සැපයීම.
14. ටයර්, ටියුබ්, ටේපර් හා වාහන වර්ග සැපයීම.
15. ක්‍රීඩා භාණ්ඩ සැපයීම.
16. ආයුර්වේද ඖෂධ සැකසීමේ අමු ද්‍රව්‍ය

**(ආ). සේවා සැපයීම.**

1. නොතාරිස් හා නීතිඥ සේවා.
2. මිනින්දෝරු සේවා.
3. වාහන සේවා කිරීම.
4. කම්මල්කරුවන්ගේ සේවා.
5. ගලිබවුසර් / වතුර බවුසර් කුලියට සැපයීම.
6. යකඩ වැඩකරුවන්ගේ සේවා (පැස්සුම් කටයුතු).
7. ආදහනාගාර අලුත්වැඩියාව.
8. වායු සමකරණ අලුත්වැඩියාව. (වාහන හා කාර්යාල)
9. ලිපි ද්‍රව්‍ය මුද්‍රණ කටයුතු.
10. කසළ කරත්ත සෞඛ්‍ය උපකරණ අලුත්වැඩියාව.
11. මෝටර් වාහන අලුත්වැඩියාව හා කුෂන් වැඩ.
12. යතුරු ලියන, රෝනියෝ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර අලුත්වැඩියාව හා සේවා කිරීම.
13. පරිගණක යන්ත්‍ර අලුත්වැඩියාව හා සේවා කිරීම.
14. අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම.
15. භාෂා පරිවර්තන සේවා සැපයීම. (ඉංග්‍රීසි / දෙමළ)

**(ඇ). කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.**

කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු

1. රු.100,000.00 ට අඩු කොන්ත්‍රාත් සඳහා රු. 2,000.00
2. රු.100,001.00 සිට 250,000.00 - දක්වා රු. 2,500.00
3. රු.250,001.00 සිට 500,000.00 - දක්වා රු. 3,000.00
4. රු.500,001.00 සිට 1,000,000.00 - දක්වා රු. 3,500.00
5. රු.1,000,001 ට වැඩි කොන්ත්‍රාත් සඳහා රු. 4,000.00

**පොදු කොන්දේසි**

1. පෙර වර්ෂයේදී අසාධුගත සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය සඳහා සුදුසුකම් නොලබන අතර, ඔවුන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.
2. ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරනු ලබන සෑම සැපයුම් හා කොන්ත්‍රාත්කරුවෙකුම තමාගේ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුයි.
3. භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් රජයේ අනුමත බදු කොන්දේසිවලට හා සභා නීති රීති වලට යටත් විය යුතුය.
4. සැපයුම්කරුවන් අවම වශයෙන් දින 60 ක කාලයක් ලබා දීම අවශ්‍ය වේ.
5. අවශ්‍ය වූ විටෙක ලියාපදිංචි ලැයිස්තුවෙන් පිටත භාණ්ඩ හා සේවා ලබා ගැනීම දෙම්පෙ ප්‍රාදේශීය සභාව සතුය.
6. අයිතම 01 ට වඩා අයදුම් කරන්නේ නම් ඒ එක් එක් අයිතමය සඳහා වෙන වෙනම අයදුම් කර අදාළ ලියාපදිංචි මුදල ගෙවීම අවශ්‍ය වේ.
7. වැඩි දුරටත් විස්තර අපගේ පොදු දුරකථන අංක 033-2269260 අංකය ඇමතීමෙන් ලබාගත හැකිය.

**2024 /10 / 01**

**ඩී. අජිත් රණසිංහ**
**ලේකම් හා දොම්පෙ ප්‍රාදේශීය සභාවේ**
**බලතල හා කාර්ය,කර්තව්‍ය ක්‍රියාත්මක**
**කිරීමේ නිලධාරී.**